# 17. මිතුරන් අතරේ යැදුම්

දේවගැතිතුමා : අද මම ස්වාමින්ගේ යාච්ඤාව ගැන ප්‍රශ්න ටිකක් අහනවා.

සුනිල් : ආ..... අපි ඉගෙන ගත්තා පාසලේ දී.

දේවගැතිතුමා : බොහොම හොඳයි.
එහෙනම් කියන්න බලන්න. ජේසුස් වහන්සේ, ස්වාමින්ගේ යාච්ඤාව කියා දුන්නේ කාටද කියලා.

කමලා : මම දන්නවා..... මම දන්නවා...... ගෝලයන්ට.

දේවගැතිතුමා : කමලා හරි. ඒත් ඇයි ගෝලයන්ට කියා දුන්නේ?

නිමල් : ගෝලයෝ ජේසුස් වහන්සේගෙන් ඉල්ලා සිටි නිසා.

දේවගැතිතුමා : නිමල් බොහොම අගෙයි.

එහෙනම් කියන්න මොනව ද ස්වාමින්ගේ යාච්ඤාවෙන් අපට ඉගෙන ගන්න පුළුවන් කියලා.

සුනිල් : ස්වර්ගයේ සිටින දෙවි පියාණන්ට ගෞරව කරන්න.

අමර : උන්වහන්සේගේ කැමැත්ත කරන්න.

නයනා : ඇයි....... අපට ලැබෙන ආහාර දෙවිපියා ලබා දෙන නිසා ස්තුති කරන්න.

දේවගැතිතුමා : තවත් තියෙනවා......... මම කියා දෙන්නම්. අපට වැරදි කරන අයට සමාව දෙන්න. අපි කරන වැරදි වලට දිනපතා සමාව ඉල්ලන්න. වැරදි වැඩ නොකර ඉන්න.
මෙන්න මේ වගේ දේවල් අපට ස්වාමීන්ගේ යාච්ඤාවෙන් ඉගෙන ගන්න පුළුවන්. අපි දැන් සියලු දෙනා ම ස්වාමීන්ගේ යාච්ඤාව කියමු.

## පැවරුම්

1. ස්වාමීන්ගේ යාච්ඤාව කටපාඩමින් කියන්න.

2. ජේසුස්වහන්සේ ගෝලයන්ට යාච්ඤා කිරීමට උගන්වන අවස්ථාව දැක්වෙන චිත්‍රයක් අඳින්න.